" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.05. 2 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්,

ආණ්ඩුකාරවර කාර්යාලය,

බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මුල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ පවතින ආකාරයෙන්ම පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීම සුදුසු වන බව 2022.05.27 දින රැස්වූ චක්‍රලේඛ පළාතට අදාල කර ගැනීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇත.

02. එම නිර්දේශය මවිසින්ද නිර්දේශ කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2018.11.12<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 04/2018 | දීප ව්‍යාප්ත සේවාවන් වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව පශ්චාත් උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම. |
| 02. | 2021.06.30<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 01/2021<br>2021.08.02<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 01/2021(1) | දීප ව්‍යාප්ත සේවාවන් හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම. |

ඩබ්.ඒම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන).

o/c
06/01

අත් කළේ :- ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 011-2136650
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } PSC/APP/7/1072/2017 (I)

ඔබේ අංකය / உமது இல. / Your No. }

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**

**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

දිනය / திகதி / Date } 2018 නොවැම්බර් මස 12 වන දින

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2018

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>දීප ව්‍යාප්ත සේවාවන්වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයන්හි විධිවිධාන අනුව පශ්චාත් උපාධි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.</u>**

දීප ව්‍යාප්ත සේවාවන්වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයන්හි සඳහන් විධිවිධාන අනුව අදාළ උසස් කිරීම් සඳහා පශ්චාත් උපාධි අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේදී, එකී සේවා ව්‍යවස්ථාවන්වල නිශ්චිතව සඳහන් විෂය ක්ෂේත්‍රයන් තෝරා ගැනීම කෙරෙහි අදාළ සියලු නිලධාරීන් අවධානය යොමු කළ යුතුය. ඉන් පරිබාහිර වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ලබා ඇති පශ්චාත් උපාධි, උසස් වීම සඳහා නියමිත සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

02. කෙසේ වුවද කිසියම් පශ්චාත් උපාධියක අදාළත්වය පිළිබඳව අපැහැදිලිතාවයක් ඇත්නම්, අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර මෙම කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු බවට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

03. එවැනි ඉල්ලීමක් යොමු කරන විට එම උපාධි පාඨමාලාවේ අන්තර්ගතය පිළිබඳව සහතික කරන ලද විස්තරාත්මක වාර්තාවක් අදාළ විශ්ව විද්‍යාලයෙන් හෝ ආයතනයෙන් ලබාගෙන එයද එකී ඉල්ලීම සමඟ ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.